# උක් පර්යේෂණ ආයතනය -2012

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ විගණන මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2012, දෙසැම්බර් 31 දිනට උක් පර්යේෂණ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ආයතනයේ ප්‍රධාන ආදායම් ප්‍රභවය වන සෙස් බදු ආදායම, මුදල් පදනම මත ගිණුම් ගත කිරීම ආයතනයේ ප්‍රතිපත්තිය වී තිබුණි. එම ප්‍රතිපත්තියට අදාළ නොවී සමාලෝචිත වර්ෂය තුළ ලැබිය යුතු වූ රු.5,057,250 ක සෙස් බදු ආදායම මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම රු.5,057,250 කින් වැඩි වී එම ප්‍රමාණයෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය අඩු වී ජංගම වත්කම් වැඩි වී තිබුණි.

#### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). 2011 වර්ෂයේ දි මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත ලබා දි තිබූ රු.68,000,000 ක මුදල එම වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල නිසි පරිදි ගැලපීම් කර තිබුණද 2012 වර්ෂයේ හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනයේ ආරම්භක ශේෂයට එය එකතු කර සමාලෝචිත වර්ෂයේ ලබාදුන් මුදලක් වශයෙන් නැවත අඩුකර දක්වා තිබුණි.

(ආ). 2013 වර්ෂයේ දි මිලදි ගන්නා ලද රු.6,500,000 ක් වටිනා මෝටර් රථ 02 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර තිබුණි. ඒ හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වත්කම් හා වගකීම් රු.6,500,000 ක් වැඩියෙන් දක්වා තිබුණි.

### 1.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

#### (අ). ලැබිය යුතු ගිණුම්

2011 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර තිබුණු ණයගැති කාල විශ්ලේෂණය වෙනස් නොකර 2012 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමගද ඉදිරිපත් කර තිබුණි. තිවැරදි ණයගැති කාල විශ්ලේෂණය අනුව වර්ෂ 2 ත් වර්ෂ 5 ත් අතර කාල පරාසයකට අයත් රු.1,955,612 ක ශේෂයක් හා වර්ෂ 5 කට වැඩි කාලයක සිට පැවත එන රු.5,100 ක ණයගැති ශේෂයක් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

#### (ආ). ගෙවිය යුතු ගිණුම්

ණයහිමියන්ගේ ශේෂවල එකතුව වූ රු.8,737,186 කින් එකතුව රු.881,222 ක ණය ශේෂ 4 ක් වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන නමුත් එම ණයහිමි ශේෂයන් පියවීමට පියවර ගෙන නොතිබුණි.

### 1.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් එක් එක් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විෂයය | වටිනාකම (රු.) | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| ණයගැතියෝ | 2,147,456 | ශේෂ සනාථ කිරීමේ ලිපි |
| ණයහිමියෝ | 8,737,186 | ශේෂ සනාථ කිරීමේ ලිපි |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව , සමාලෝචිත වර්ෂයේ ආයතනයේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු. 7,900,416 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ රු.19,495,035 ක අතිරික්තයක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් කටයුතු වල ප්‍රතිඵලය රු.27,395,451 ක පිරිහීමක් නිරීක්ෂණය විය.සමාලෝචිත වර්ෂයේ සෙස් බදු ආදායම රු.4,795,630 කින් අඩුවීම හා මෙහෙයුම් වියදම් රු.22, 197,015 කින් ද විදේශ ගමන් වියදම් රු.3,906,167 කින් ද, නඩත්තු වියදම් රු.3,891,296 කින් ද පර්යේෂණ හා සංවර්ධන වියදම් රු. 3,975,481 කින් වැඩිවීම මෙහෙයුම් කටයුතු වල ප්‍රතිඵලය පිරිහීමට බලපා තිබුණි.

## 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

(අ) විදේශ ගමන්, ප්‍රවාහන වියදම් හා පර්යේෂණ වියදම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව පිළිවෙලින් සියයට 417 ක් ද සියයට 50 ක් ද හා සියයට 67 ක් ද වශයෙන් වැඩිවී තිබුණි.

(ආ) 2013 වර්ෂයට අදාළ උපචිත වියදමක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් වීම නිසා ගෙවිය යුතු ගිණුම් සියයට 117 කින් වර්ධනය වී තිබුණි.

## 2.3 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

(අ) ආයතනයේ සේවය කළ පුද්ගලයන් දෙදෙනෙකුට එරෙහිව ආයතනය විසින් නඩු විෂයයන් දෙකක් පවරා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම නඩු විභාග වෙමින් පැවතුණි.

(ආ) ආයතනය හැර ගිය නිලධාරිනියකට එරෙහිව රු.2,974,960 ක වන්දි මුදලක් ඉල්ලා ආයතනය විසින් නඩුවක් පවරා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම නඩු විභාග වෙමින් පැවතුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සෙස් බදු මුදල් රුස් කිරීම

රේගු දෙපාර්තමේන්තුව සමග බැඳුම්කරයට යටත්ව මහා පරිමාණිකව සීනි ආනයනය කරන ව්‍යාපාරිකයන් විසින් සීනි ආනයනය කර බන්ධිත ගුදම්වල තැන්පත් කරනු ලබන අතර එම සීනි තොග සඳහා සෙස් බදු මුදල් අය කර ගනු ලබන්නේ ඒවා නැවත බන්දිත ගුදම් වලින් නිකුත් කිරීමේදිය. ඉහත කී මහා පරිමාණිකව සීනි ආනයනය කිරීම්වලට අදාළ වාර්තා ආයතනය විසින් රේගුවෙන් ලබාගෙන ඊට අදාළ නිකුත් කිරීම් (Ex bond Sales) සමඟ සැසඳීමක් සිදු කර නොතිබුණි. එමනිසා ඉහත කී මුළු සීනි තොගයන් සඳහා සෙස් බදු මුදල් නැවත කොටස් වශයෙන් අයකර ගෙන ඇති බව තහවුරු කිරීමට ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) <u>නඩත්තු ඒකකය</u>

(i) සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් දක්වා පමණක් නඩත්තු හා ඉදිකිරීම් ක්‍රියාකාරකම් 12 ක් සඳුකිරීමට සැලසුම් කර තිබූ අතර ඒ සඳහා අවශ්‍ය වන අයවැය පිරිවිතරයන් දැක්වෙන පරිද ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණි.

(ii) නඩත්තු ඒකකයේ සමස්ත වියදම හඳුනාගෙන තිබුණද එක් එක් කාර්යයන්ගේ වියදම වෙන වෙනම හඳුනා නොගැනීම හේතුවෙන් කාර්යයන් අතර වියදම් පාලනයක් සදුවි නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය තුළ ඉටුකිරීම සඳහා සකස් කළ යෝජිත ක්‍රියාකාරි සැලැස්ම තුළ අන්තර්ගත වැඩසටහන් 03 ක් වර්ෂය තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) <u>ගබඩා අංශය</u>

ආයතනයේ ප්‍රධාන ගබඩාවට අදාළව තොග වාර්තා පවත්වාගැනීමට විධිමත් බින්කාඩ් පද්ධතියක් නොතිබුණි.

(ඈ) <u>ස්ථාවර වත්කම් ලේඛනය</u>

(i) ආයතනය විසින් යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයේ සමහර වත්කම් භෞතිකව නොතිබුණු අතර භෞතිකව පවතින සමහර වත්කම් ලේඛනයෙන් මගහැරී තිබුණි.

(ii) ආයතනයේ ගබඩා අංශයෙන් නිකුත් කරන ස්ථාවර වත්කම් විධිමත් සංකේතකරණයකින් තොරව නිකුත් කර තිබුණි.

3.2 <u>**මෙහෙයුම් අකාර්යක්ෂමතා**</u>

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ) උක් පර්යේෂණ ආයතනය පසුගිය වසර 15 ක කාලය තුළ විශාල පර්යේෂණ වියදමක් කර වැඩි සීනි සංයුතියක් සහිත උක් ප්‍රභේද ගණනාවක් හඳුන්වා දී තිබුණද, එම ප්‍රභේදයන් ගොවීන් අතර ව්‍යාප්ත නොවීම නිසා පර්යේෂණ වල ප්‍රතිඵල සාර්ථක ලෙස ක්‍රියාත්මක වී නොතිබුණි .

(ආ) වැඩි සීනි සංයුතියක් සහිත උක් ප්‍රභේදයන් උක් පර්යේෂණ ආයතනය විසින් හඳුන්වා දී තිබුණත්, උක් දඬු මිලදී ගනු ලබන ආයතන විසින් උක් ගසේ අඩංගු සීනි සංයුතිය වෙනුවට එහි බර හා විශාලත්වය පදනම් කරගෙන මිලදී ගැනීම සිදුකර තිබීම නිසා ගොවීන් නව ප්‍රභේද වගා කිරීමට මැලිවී තිබුණි.ඒ හේතුව නිසා දැනට වගා කර ඇති බිම් ප්‍රමාණයෙන් ලබාගත හැකිව තිබුණු අස්වැන්න අඩු වීම නිසා දේශිය සීනි නිෂ්පාදනය අඩු වී තිබුණි.

## 3.3 මතභේදයට තුඩු දෙන ගනුදෙණු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

ඉංජිනේරු අංශය මගින් උක් වගාවට අදාල යන්ත්‍ර සූත්‍ර පිළිබඳ පර්යේෂණ වැඩසටහන් පැවැත්වීම හා ඊට අදාල උපකරණ නිපදවීම සිදුකරනු ලබයි. ඊට අමතරව ආයතනයේ මෝටර් රථ වාහන නඩත්තු කිරීමද සිදුකරනු ලබයි. 2012 වර්ෂය තුළ මෙම අංශය විසින් පර්යේෂණ ව්‍යාපෘති හා පර්යේෂණ සේවා ව්‍යාපෘති 09 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. ඒ සම්බන්ධව සිදුකරනු ලද නියැදි පරීක්ෂාවේදී පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) උක් අස්වනු යන්ත්‍රයක් හඳුන්වාදීමේ ව්‍යාපෘතිය (MT/01/11)

උක් අස්වනු නෙළීමේ කාර්යක්ෂමතාව වැඩි කිරීම හා උක් නෙළීමේ පිරිවැය අඩුකිරීමේ අරමුණ ඇතිව ඉකුත් වර්ෂවල සිට දේශිය වගා භූමි වලට ගැලපෙන ආකාරයට උක් අස්වනු ය නෙළීමේ යන්ත්‍රයක් නිපදවා අත්හදා බැලීම් සිදුකර තිබුණි. 2012 වර්ෂයේදී ද එම අවශ්‍යතාවය හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමට පිළියෙල කළ ක්‍රියාකාරි සැලැස්මට අනුව රු.440,000 ක ප්‍රතිපාදන සලසා තිබුණ. නමුත් මෙම පර්යේෂණ ව්‍යාපෘතියට අදාල කිසිදු කාර්යක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) උක් රොඩු කපන යන්ත්‍රයක් හඳුන්වාදීමේ ව්‍යාපෘතිය (MT/02/11)

උක් දඩු නෙළීමේ දී පවතින දුර්වලතා මගහරවා ගැනීමට සාර්ථක පිළියමක් වශයෙන් හා ශ්‍රම පිරිවැය අවම කර ගැනීමේ අරමුණින් ආයතනය විසන් ඉහල කාර්යක්ෂමතාවයකින් යුත් උක් රොඩු කැපීමේ යන්ත්‍රයක් හඳුන්වාදීමට සැලසුම් කර තිබුණි. ක්‍රියාකාරි සැලැස්ම අනුව මෙම ව්‍යාපෘතිය සඳහා රු.560,000 ක ප්‍රතිපාදන සලසා තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම ව්‍යාපෘතියට අදාල මූලික වැඩ සැලැස්මක් පමණක් නිර්මාණය කර තිබුණි.

(ඇ) උක් බීජ වෙන් කිරීමේ උපකරණයක් නිර්මාණය කිරීම හා සැකසීම.

මෙම ව්‍යාපෘතිය සඳහා ක්‍රියාකාරි සැලැස්මට අනුව රු.810,000 ක් වෙන් කර තිබුණද 2012 වර්ෂය තුළ ඒ සම්බන්ධව කිසිදු ක්‍රියාකාරකමක් සිදුකර නොතිබුණි.

## 3.4 නිෂ්කාර්ය වත්කම් හා ඌන උපයෝජිත වත්කම්

අලුත්වැඩියා කර භාවිත කළහැකි ලෙසට නිර්දේශ කර තිබූ ශිතකරණ 06 ක් අලුත්වැඩියා කිරීමකින් තොරව වසර 3 ක කාලයක් ආයතනයේ ප්‍රධාන ගබඩාව තුළ දිරාපත් වෙමින් පැවතුණි.

### 3.5 ප්‍රමාද වූ ව්‍යාපෘති

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ) 2012 වර්ෂය වෙනුවෙන් පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අයවැයෙන් රු.66,000,000 ක ප්‍රතිපාදන සලසා තිබුණද භාණ්ඩාගාරයේ අනුමැතිය නොලැබීම නිසා සමාලෝචිත වර්ෂය තුළ කිසිදු උපයෝජනයක් කර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| ව්‍යාපෘතියේ නම | සලසා තිබුණු ප්‍රතිපාදනය රු. |
|---|---|
| විද්‍යාගාර සංකීර්ණයක් හා සංවර්ධන මධ්‍යස්ථානයක් ඉදිකිරීම -උඩවලව | 65,000,000 |
| කෘමින් අධ්‍යනය කිරීමේ මධ්‍යස්ථානය ඉදිකිරීම | 1,000,000 |
| එකතුව | 66,000,000 |

(ආ) උක් මල් මුහුන් කිරීමේ මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා 2012 වර්ෂයේ රු.2,000,000 ක අයවැය මගින් ප්‍රතිපාදන සලසා තිබුණද වර්ෂය අවසාන වන විටත් අදාල ඉදිකිරීම් ආරම්භ කර නොතිබුණි. මෙහි මුල් ගල තැබීමේ සමාරම්භක උළෙල සඳහා රු.179,505 ක් 2012 වර්ෂයේදී වැය කර තිබුණි.

### 3.6 කාර්ය මණ්ඩල පරිපාලනය

**පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ) 2012 දෙසැම්බර් 31 දිනට වූ කාර්ය මණ්ඩලය පිළිබඳ තත්ත්වය පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 09 | 06 | 03 |
| තෘතියික මට්ටම | 25 | 19 | 06 |
| ද්විතියක මට්ටම | 52 | 36 | 16 |
| ප්‍රාථමික මට්ටම | 107 | 102 | 05 |
| | 193 | 163 | 30 |

(ආ) ආයතනයේ කළමනාකාර සහකාර පුරප්පාඩු 06 ක් සම්පූර්ණ කිරීම සඳහා පුවත් පත් දැන්වීම් පළකර වර්ෂ 02 ක් ගතවී තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් එම තනතුරු වලට අදාළ පුරප්පාඩු සම්පූර්ණ කර නොතිබුණි.

(ඇ) කළමනාකාර සහකාර (ලිපිකරු/ගිණුම්), පොත් තබන්නා, ගිණුම් නිලධාරි යන තනතුරු පුරප්පාඩු වීම හේතුවෙන් ගිණුම් අංශයේ මුදල් ගනුදෙන හා ගිණුම්කරණ කාර්යයන්ට අදාළව විධිමත් වැඩ පැවරීමක් සිදුකර නොතිබුණි.

(ඈ) ගිණුම් අංශයේ කාර්ය මණ්ඩලයෙ පුරප්පාඩු තිබීම හේතුවෙන් 2012 වර්ෂයෙ පොත් තැබීම හා අවසන් ගිණුම් පිළියෙල කිරීම සඳහා රු.250,000 ක ගිවිසගත් මුදලකට බාහිර විගණන ආයතනයට පැවරීමට සිදුවී තිබුණි.

## 3.7 වාහන උපයෝජනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ). ආයතනය සතු වාහන වල අලුත්වැඩියා කටයුතු ආයතනයේ යාන්ත්‍රික තාක්ෂණ අංශය මඟින් මෙන්ම ආයතනයට පරිබාහිර වූ වෙනත් ආයතන මඟින් ද ඉටුකර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ යාන්ත්‍රික තාක්ෂණ අංශය මඟින් සිදුකර තිබූ වාහන අලුත්වැඩියාවන් 96 කට අදාළව වියදම් ඇස්තමේන්තුවක්, දැරූ පිරිවැය හඳුනාගැනීම සඳහා වූ පිරිවැය ගිණුම්කරන ක්‍රමවේදයක් නොතිබුණි.

(ආ). එක් එක් වාහනය සම්බන්ධයෙන් බාහිර ආයතන මඟින් සිදුකළ සමහර අලුත්වැඩියාවන්ට අදාළ වටිනාකම් එම එක් එක් වාහන ලිපිගොනුවේ නොතිබුණි.

## 4. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

**(අ)** ගිණුම්කරණය

**(ආ)** සෙස් ආදායම

**(ඇ)** ස්ථාවර වත්කම්

**(ඇ)** ගබඩාකරණය.